රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 19/2017(II)

මගේ අංක : PL/7/3/ඩෙංගු/චක්‍රලේඛ
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2023.06.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>ඩෙංගු රෝගය වැළැක්වීම සහ පාලනය සඳහා "ආයතනික ඩෙංගු මර්දන දිනයක්" ප්‍රකාශයට පත් කිරීම</u>**

ඩෙංගු රෝගය වැලැක්වීම හා පාලනය යන මැයෙන් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති අංක: PS/ EAD/Circular/ 06/2023 හා 2023.04.20 දිනැති චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. සීඝ්‍රයෙන් පැතිරෙමින් පවත්නා ඩෙංගු වසංගත තත්ත්වය මේ වන විට සමාජය මුහුණ පා ඇති ප්‍රධානතම සෞඛ්‍ය ගැටලුවක් බවට පත් වී ඇති අතර සෞඛ්‍ය අංශවලට අදාල තොරතුරු අනුව බස්නාහිර පළාත අධි අවදානම් කලාපයක් ලෙසට හඳුනාගෙන ඇත. එසේම දිවයිනේ සෙසු දිස්ත්‍රික්කවල ද සීඝ්‍ර වශයෙන් ඩෙංගු රෝගයේ ව්‍යාප්තියක් ඇති වීමේ අවදානමක් පෙන්නුම් කරන බවත්, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, ඉදිකිරීම් පරිශ්‍ර, පාසල්, ආගමික ස්ථාන, ධීවර කටයුතු ආශ්‍රිත ප්‍රදේශ, නිවාස සහ පොදු ස්ථාන, මදුරුවන් බෝවීමේ අවදානම වැඩි ස්ථාන වශයෙන් මේ වන විට හඳුනාගෙන ඇත.

03. මෙම පසුබිම තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර ඩෙංගු මර්දන කටයුතු, ජාතික, පළාත්, දිස්ත්‍රික්, ග්‍රාමීය, නිවාස මට්ටමින් සියලු අංශවල සක්‍රීය දායකත්වය ඇතිව ක්‍රියාත්මක කිරීමෙහි ඇති වැදගත්කම පිළිබඳව අවධානය යොමු වී ඇත. මේ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවකදී ද අදාල ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදී. එම සාකච්ඡාවේදී **සිකුරාදා දිනය "ආයතනික ඩෙංගු මර්ධන දිනය"** ලෙස ප්‍රකාශයට පත්කිරීමටත්, ඒ වෙනුවෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් තීරණය විය.

04. ඒ අනුව, සියලුම රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ ඩෙංගු මදුරුවන් බෝවීම පාලනය කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත පහත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

i. සතියේ **සිකුරාදා දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා** පැයක කාලයක් මදුරු කීටයන් බෝවන ස්ථාන හඳුනාගෙන සියළුම සේවකයින්ගේ සක්‍රීය දායකත්වයෙන් පිරිසිදු කිරීමේ කටයුතු සිදු කළ යුතු අතර, එම වැඩසටහන හැකි තරම් සෞඛ්‍ය අංශ හා එක්ව ඒකාබද්ධව සිදු කරලීමට

ii. ඩෙංගු මදුරුවන් හෝ බෝවන වසංගත රෝගී තත්ත්ව පිළිබඳ නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ආයතන පරිශ්‍ර තුළ කටයුතු සූදානම් කිරිමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතු වේ.

iii. සෑම රාජ්‍ය ආයතනයකම (රෝහල්, පාසල්, කාර්යාල) ඩෙංගු මර්දනය පිළිබඳ කටයුතු සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර ඔවුන්ගේ අධික්ෂණය යටතේ මෙම කටයුතු විධිමත්ව සිදු කළ යුතු අතර, ඩෙංගු මර්දන ක්‍රියාකාරකම් අවම වශයෙන් සතිපතා ක්‍රියාත්මක විය යුතුය. අදාළ උපදෙස් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් ලබා දෙනු ලබන අතර එකී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තාවක් සෑම ආයතනයක් විසින්ම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත මාසිකව ලබා දීමට කටයුතු කරන්න.

05. ඩෙංගු මර්දන කටයුතුවලට සමගාමීව එම කටයුතු මෙහෙයවීම දැඩි අධීක්ෂණයකට ලක්විය යුතු බැවින් සියලුම රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් පහත සඳහන් පරිදි අධීක්ෂණ කටයුතු සිදුකළ යුතු වේ.

i. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වල න්‍යාය පත්‍රයන්ට ඩෙංගු වසංගත රෝග ව්‍යාප්තිය වැළැක්වීම හා පාලනය සඳහා වන සැලසුම් හා ඒවායේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සිදු කළ යුතු අතර, ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා කාර්යයන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වල මඟ පෙන්වීම හා අදාළ ප්‍රදේශයේ මහා නගර සභා, නගර සභා, ප්‍රාදේශිය සභා ඇතුළු පළාත් පාලන ආයතනවල සක්‍රීය දායකත්වය මත සිදු කළ යුතුය.

ii. ඩෙංගු අධි අවදානම් ස්ථාන ලෙස සැලකිය හැකි ඉදිකිරීම් පරිශ්‍ර, පාසැල්, ආගමික ස්ථාන ඇතුළු පොදු ස්ථාන සහ සෞඛ්‍ය අංශ විසින් ඩෙංගු අධි අවධානම් ස්ථාන ලෙස නම් කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය. ජාතික ඩෙංගු මර්ධන ඒකකය හා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ විසින් ලබා දෙන මාර්ගෝපදේශ අනුව මෙම ස්ථානයන්හි ඩෙංගු ව්‍යාප්ත වීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු නොපමාව ක්‍රියාත්මක කළ යුතුය.

iii. ඩෙංගු මර්ධනය අරමුණු කොට ගෙන, ඉදිකිරීම් ගිවිසුම් වලට ඉදිකිරීම් පරිශ්‍ර සඳහා වන නීති රීති සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් කිරීමත්, හිස් ඉඩම්, අනේවාසික දේපළ හා ධීවර වරායන් ආශ්‍රිතව ඇති භාවිතා නොවන/ අත්හැර දැමූ හෝ හිමිකරුවකු නොමැති බෝට්ටු යනාදිය තුළ ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කළ යුතු වේ. එමෙන්ම සෑම පළාත් පාලන ආයතනයක්ම තම බල ප්‍රදේශය තුල මේ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක විය යුතුය.

iv. ඩෙංගු රෝගය වසංගත තත්ත්වයක අවධානම පිළිබඳව ජාතික, පළාත් හෝ දිස්ත්‍රික් සෞඛ්‍ය අංශ විසින් දන්වා සිටින අවස්ථාවන්හිදී, අදාළ පාර්ශවයන්ගේ ක්‍රියාකාරී සහයෝගය සෞඛ්‍ය අංශ වෙත ලබා දීම ප්‍රමුඛ කර්තව්‍යයක් ලෙස සැලකිය යුතුය. තව ද, අවස්ථානුකූලව ඩෙංගු මර්දන හා පාලන කටයුතු සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම ආයතන ප්‍රධානීන් විසින් නොපමාව සිදු කළ යුතුය.

06. ඉහත ක්‍රියාමාර්ග අනුව ඩෙංගු වසංගත තත්ත්වය තුරන් කර ගැනීමට ඔබගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ කටයුතු සිදු කළ යුතු අතර සෞඛ්‍යයට හිතකර ලෙස සියළු ආයතන පරිශ්‍ර පවත්වා ගැනීමට ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකතන අංකය : 011 2302722
ෆැක්ස් අංකය : 011 2302722
විද්‍යුත් ලිපිනය : addsec.pclg@pclg.gov.lk

පිටපත්:

01.ජනාධිපති ලේකම් (ජනාධිපති ලේකම් කාර්යාලය ) - කරු. ඔබගේ අංක PS/EAD/circular/06/2023 හා 2023.04.20 දිනැති චක්‍රලේඛය අනුව දැ.ගැ.ස.

02.ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය - කරු. ඔබගේ අංක:NDCU/AF/OBR/MIS/94/2022 හා 2023.06.06 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.